# රජයේ නිවේදනයයි

## 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

## 2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2020 නොවැම්බර් මස 18 දින සිට ආරම්භ වන මාස 06 ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2020.10.13 දිනැති අංක 2197/12 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් ටින්මාළු සඳහා ප්‍රකාශිත අදාල නියමය 2020 නොවැම්බර් මස 18 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

**මහින්ද රාජපක්ෂ**
**මුදල් අමාත්‍ය**

2020 නොවැම්බර් මස 17 වන දින
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේදීය.

### උපලේඛනය

| 1 වන තීරය | | | | 11 වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. වි. ශීර්ෂය | සං. වි. සංකේතය | විස්තරය | |
| 1 | 16.04 | 1604.11 | සැමන් | කි. ග්‍රෑමයට රු.100 |
| | | 1604.12 | හුරුල්ලන් | කි. ග්‍රෑමයට රු.100 |
| | | 1604.13 | සාඩින්, සාඩිනෙල්ලා සහ බ්‍රිස්ලින් හෝ හාල්මැස්සන් | කි. ග්‍රෑමයට රු.100 |
| | | 1604.14 | ඇටවල්ලා, ස්කිප්ජැක් සහ බොනිටො (සර්ඩා විශේෂයන්) | කි. ග්‍රෑමයට රු.100 |
| | | 1604.15 | මැකරල් | කි. ග්‍රෑමයට රු.100 |
| | | 1604.16 | ඇන්චෝවීසි | කි. ග්‍රෑමයට රු.100 |
| | | 1604.17 | ආඳන් | කි. ග්‍රෑමයට රු.100 |
| | | 1604.19 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු.100 |
| | | 1604.20 | අනෙකුත් සකස් කළ හෝ සුරක්ෂිත මාළු | කි. ග්‍රෑමයට රු.100 |